# ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය හා ඉන්දීය සංචාරකයින්:

## අත ළඟ ඇති දැවැන්ත වෙළඳපොළ

### 1. හැඳින්වීම

මිලියන 11 කට අධික වූ ඉන්දීය සංචාරකයින්ගෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන්නේ 1% ක් පමණි. ඉන්දියාව දැවැන්ත ප්‍රභව වෙළඳපොළක් පමණක් නොව, වේගයෙන් වර්ධනය වන වෙළඳපොළවල් රාශියක එකතුවකි. එබැවින් ඕනෑම නිෂ්පාදනයක් ප්‍රභේදනය කොට සැපයීමෙන් එම කර්මාන්තයේ පුළුල් වීමට හා එහි පරිමාණානුකූල ප්‍රතිලාභ අත්කර ගැනීමට ඉන්දීය වෙළඳපොළ තුළ ඉඩ ප්‍රස්තා ඇත.

ඉන්දියාව හෝ ලංකාව යන රටවල් දෙකෙහිම කිසිදු ප්‍රතිපත්තිමය උත්සාහයක් නොමැතිව වුවද ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රගතිය සඳහා ඉන්දියාව වැදගත් වී තිබේ. මේ වනවිටත් ලංකාවට සංචාරකයින් පැමිණෙන රටවල් අතර ඉන්දියාව ප්‍රමුඛස්ථානයට පත්ව ඇත. මුහුදු හෝ ගුවන් මගින් ගමනාගමනය සඳහා ඇති සමීප පිහිටීම, ඓතිහාසික හා සංස්කෘතික සම්බන්ධතාව සහ වේගයෙන් පුළුල් වන ආර්ථිකමය සම්බන්ධතා ආදිය ලංකාව ඉන්දීය සංචාරකයින්ගේ පාරාදීසයක් වීමට බලපාන ලංකාවට සුවිශේෂ වූ සාධක වේ.

ලංකාවේ සංචාරක කර්මාන්තයේ භව්‍ය ප්‍රගතිය පහසු කිරීම ලාංකික සංචාරක ප්‍රතිපත්ති සම්පාදනය හා සම්බන්ධ කරුණකි. සංචාරක කර්මාන්තයේ පුළුල්වීමට එරෙහිව ඇති අවහිරතා තුරන් කිරීම හා ඉන්දියාවේ ප්‍රභේදනය වූ සංචාරක වෙළඳපොළට ප්‍රභේදනය වූ සංචාරක සේවා සපයමින් පුළුල් වීම අවශ්‍යතාවන් බවට පත්වී ඇත.

මෙම ප්‍රතිපත්ති සමාලෝචනය තුළින් අපේක්ෂා කෙරෙන්නේ ඉන්දීය සංචාරකයිනට ලංකාව සිත්ගත් සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත්කිරීම සඳහා මාර්ගෝපදේශකත්වයක් සැපයීමයි. මෙම අරමුණ සඳහා ඉන්දීය සංචාරකයින්ගේ සුවිශේෂ අංගලක්ෂණ හා ඔවුන් වෙනුවෙන් ලංකාවට ඉදිරිපත් කළහැකි විවිධාංගීකරණය වූ සංචාරක සේවා හඳුනාගත යුතුවේ.

| ආසියානු රටවල වාර්ෂික සංචාරක පැමිණීම් 2008 | | |
|---|---|---|
| | ප්‍රමාණය (මිලියන) | ජනගහනයේ ප්‍රතිශතයක් වශයෙන් |
| චීනය | 53.1 | 4.0 |
| මැලේසියාව | 22.1 | 81.7 |
| හොංකොං | 17.3 | 247.4 |
| තායිලන්තය | 14.2 | 21.7 |
| සිංගප්පූරුව | 7.5 | 155.6 |
| ඉන්දුනීසියාව | 6.3 | 2.7 |
| ඉන්දියාව | 5.1 | 0.5 |
| වියට්නාමය | 4.2 | 4.9 |
| කාම්බෝජය | 2.0 | 13.3 |
| ශ්‍රී ලංකාව | 0.4 | 2.2 |

ලංකාව ආසියාවේ ජනප්‍රිය සංචාරක කේන්ද්‍රස්ථා-නයක් නොවේ ජනගහණය, ඉතිහාසය, සංස්කෘතිය, ස්වාභාවික පරිසරය, දේශගුණය, ගහකොළ හා වෙනත් බොහෝ දෑ සම්බන්ධයෙන් වූ විවිධත්වය කුඩා දූපතක කැටිකොට ගත් ලංකාව ලෝකයේ වඩාත් මනරම් සංචාරක කේන්ද්‍රස්ථානයක් ලෙස සැලකේ. එහෙත්, සංචාරක පැමිණවීම් අතින් ලංකාව කලාපයේ රටවල් අතර බෙහෙවින් පසුගාමී වූ රටකි. සංචාරක පැමිණීම් හා ඉපයීම් අතින් ලෝකයේ ප්‍රථම රටවල් 5 අතරට ආසියාවෙන් අයත් වන්නේ චීනයයි. වෙනත් බොහෝ ආසියානු රටවලට වර්ෂයකට සංචාරකයින් මිලියන ගණනින් පැමිණෙන අතර, මෙයින් සමහරක වාර්ෂික සංචාරක ප්‍රමාණය ඒවායේ මුළු ජනගහණයටද වඩා වැඩිවේ.

Source: World Tourism Organization (2010), World Bank (2010)

## 2. සංචාරක කර්මාන්තයේ ආර්ථිකමය පැතිකඩ

සංචාරක කර්මාන්තය යනු විදේශ විනිමය ඉපැයෙන ''අපනයන භාණ්ඩයකි''. මෙම කර්මාන්තය තුළ සංචාරක අවශ්‍යතා සඳහා යොමු වූ භාණ්ඩ හා සේවා රාශියක් නිපැදවෙන ව්‍යාපාර හා සංවිධාන සමූහයක් අන්තර්ගත වේ.

- සංචාරක කර්මාන්තය දිළිඳු රටවල් ගෝලීය ආර්ථිකය තුළ කොන්වීම වළකාලන ඉතාම වැදගත් අංශයකි. එමෙන්ම රටක් තුළ වුවද, ප්‍රාදේශීය වශයෙන් හා සමාජමය වශයෙන් කොන්වීම ද ඒ තුළින් වළකාලයි.

- වෙනත් බොහෝ සේවා අංශ සමග සසඳන කළ සංචාරක කර්මාන්තය අතිශයින් ශ්‍රම-සූක්ෂම වූවකි. එබැවින් සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය යනු අවශ්‍යයෙන්ම වැඩි වේගයෙන් රැකියා බිහි කිරීමකි. එය විශේෂයෙන්ම ''උගත්-තරුණ'' පරපුරේ අපේක්ෂාවන්ට ගැලපෙන රැකියා බිහිකරන අංශයකි.

- සංචාරක ව්‍යාපාරය අත්‍යවශ්‍යයෙන්ම දිළිඳුකම තුරන්කිරීමේ උපාය මාර්ගයන් අතර සුවිශේෂ අංශයකි. එයට හේතුව සංචාරක ව්‍යාපාරය ඉදිකිරීම්, කෘෂිකර්මය, ගමනාගමනය, යටිතල පහසුකම් ආදී අංශවල දියුණුවට සෘජු සම්බන්ධතාවක් තිබීමයි.

- සංචාරක ව්‍යාපාරය ප්‍රාදේශීය සංවර්ධන අසමානතා වියැකී යාමට තුඩුදෙන අංශයකි. ඒ තුළින් ප්‍රාදේශීය අනන්‍යතාවන් ඉස්මතු වන හා ප්‍රාදේශීය ආර්ථිකමය කටයුතු දියුණුවන ආකාරයේ ආර්ථික වෘද්ධියකට මග පැදෙයි.

## 3. සංචාරකයින් පැමිණෙන රටවල් අතර ඉන්දියාව පෙරමුණටම

පසුගිය දශකය තුළ ලංකාවට පැමිණෙන සංචාරකයින් ගේ සංයුතිය බෙහෙවින් වෙනස් වී ඇත. ආසියානු රටවලින් පැමිණෙන සංචාරකයින් ප්‍රමාණය වැඩි වී ඇති අතර, සාම්ප්‍රදායිකව ලංකාවට වැඩිම සංචාරකයින් පැමිණෙන රට වූ එක්සත් රාජධානිය ඉක්මවා ඉන්දියාව ප්‍රමුඛස්ථානයට පැමිණ තිබේ. 2002 වර්ෂයේ දී 100% කට වැඩි අනුපාතයකින් එක්වරම ඉහළ ගිය ඉන්දීය සංචාරකයින් 2007-2009 කාලය තුළ හැර දිගටම වර්ධනය වනු දක්නට ලැබිණ. දශකයේ මුල් කාලයේදී ලංකාවේත් ලෝකයේත් ඇතිව තිබූ අනාරක්ෂිතබව හේතුවෙන් බටහිර රටවලින් පැමිණෙන සංචාරකයින් අඩුවීමෙන් ඇති වූ හිදැස පුරවනු ලැබූයේ ද ඒ සමග වැඩි වූ ඉන්දීය සංචාරක පැමිණීම් තුළිනි.

ඉන්දීය සංචාරකයින්ගේ වැඩිවීම රටවල් දෙක අතර ආර්ථික සබඳතා පුළුල්වීමේ හා 2002 වසරේදී සාක් කලාපයේ රටවලට විවෘත කරනු ලැබූ නිදහස් වීසා ලබාදීමේ (ඩසී දබ'රරසඩ්ක) ප්‍රතිපත්තියේ ප්‍රතිඵලයකි. ඉන්දියාව 1990 දී ''විවෘත ආර්ථික'' පිළිවෙතට පිවිසීමත්, 2000 සිට ක්‍රියාත්මක කළ ඉන්දු-ලංකා වෙළඳ ගිවිසුමත් හේතුවෙන් රටවල් දෙක අතර පුළුල් ආර්ථික සබඳතා වලට අඩිතාලම වැටී තිබුණි. ඉන්දියාව හා ලංකාව අතර වර්ධනය වන ආර්ථික සබඳතාව භාණ්ඩ වෙළඳාම ඉක්මවා ගොස් ආයෝජනය, ගුවන් ගමන්, වරාය කටයුතු, සෞඛ්‍ය හා අධ්‍යාපන ආදී ක්ෂේත්‍ර ගණනාවක් ආවරණය කෙරෙමින් පුළුල් විය. මෙසේ ශක්තිමත් වෙමින් පැවැති ආර්ථික සබඳතාව සමඟ සංචාරක පැමිණීම ද පුළුල් විය.

ලංකාවේ දැනට පවත්නා සාමකාමී වාතාවරණය තුළ වෙනත් රටවලින් පැමිණෙන සංචාරකයින් විශාල ලෙස වැඩි විය හැකිය. එම වැඩිවීම ඉන්දීය සංචාරක ප්‍රමාණය ඉක්මවා යාමට තරම් පුළුල් විය හැකි වුවත්, ලංකාවේ විශාලතම ප්‍රභව සංචාරක වෙළඳපොළක් වශයෙන් ඉන්දියාවේ වැදගත්කම අඩු නොවනු නිසැකය.

### විවේකය හා විනෝදය පමණක්ම නොවේ...

ඉන්දියාවෙන් ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් 40% කගේ සංචාරක අරමුණ විවේකය හා විනෝදය නොව ව්‍යාපාරික කටයුතු, රැස්වීම් හා සම්මන්ත්‍රණ, නෑදෑ හිතමිතුරන් දැකීම, ආගමික හා සංස්කෘතිකමය කටයුතු ආදිය වේ. මෙම අරමුණු සහිතව බටහිර යුරෝපයෙන් සංචාරකයින් පැමිණෙන්නේ 15% ක් පමණි.

කෙසේ වෙතත්, ඉන්දීය සංචාරකයින්ගේ අරමුණ සම්බන්ධයෙන් වාර්තාගත දත්ත විශාල ලෙස අවතක්සේරු වී ඇති බව පෙනේ. සංචාරක අරමුණ කුමක් වුවත් රටට ඇතුළු වීමේ ක්‍රියා පිළිවෙත් හා දුෂ්කරතා මගහැරීම සඳහා තම අරමුණ ''සංචාරක'' වශයෙන් වාර්තා කිරීමට සංචාරකයින්ගේ නැඹුරුවක් ඇත. ''නිදහස් වීසා'' ක්‍රමය ද සංචාරකයින් දුෂ්කරතාවට පත් කරනු ලබන අවුල් සහගත වූවක් බව සඳහන් කළ යුතුය. එය අදාල වන්නේ විවේකය හා විනෝදය අරමුණු කරගත් සංචාරකයින්ට පමණක් වන අතර, අනෙකුත් අරමුණු සඳහා පැමිණෙන්නන්ට එය අදාල නොවීම මෙම අවුල් සහගත බවට හේතුවයි. මේ කරුණු වලට අමතරව, විශේෂයෙන්ම ඉන්දීය සංචාරකයින් අරමුණු කීපයක් ඇතුළත් වූ අවශ්‍යතා සඳහා ද පැමිණෙන බව අමතක නොකළ යුතුය.

### සංචාරක පැමිණීම් අඩු කාලයේ දී කර්මාන්තය පවත්වා ගැනීම

ඉන්දීය හා බටහිර සංචාරකයින් අතර වැදගත් වෙනස්කමක් වන්නේ වාර්ෂික සංචාරක පැමිණීම් අඩු- වැඩි වන කාලවකවානුවයි. බටහිර සංචාරකයින් වැඩිවන්නේ එම රටවල සීත කාලය (නොවැම්බර්-පෙබරවාරි) හා ග්‍රීෂ්ම නිවාඩු කාලය (ජූලි - අගෝස්තු) තුළයි. එහෙත් මෙම කාලවකවානුව ඉන්දීය සංචාරක පැමිණීම් වලට අදාල නොවන බව පෙනේ. ඔවුන් වැඩි වශයෙන් පැමිණෙන්නේ බටහිර සංචාරක පැමිණීම් අඩුවන කාලවකවානුවේදීය. එම කාලය තුළ ඔවුන්ගේ මෙරට වියදම අඩුවීම මෙයට එක් හේතුවක් විය හැකිය. මෙය ලංකාවේ සංචාරක ව්‍යාපාරයටද වාසිදායක වන්නේ, බටහිර සංචාරකයින්ගෙන් හිස්වන කර්මාන්තය ඉන්දීය සංචාරක පැමිණීම් හේතුවෙන් පවත්වා ගත හැකි වීමයි.

### අඩු වියදමකින් අඩු කාලයක් රැඳී සිටීම

බටහිර සංචාරකයින් හා සසඳන කළ, සාමාන්‍යයෙන් ඉන්දීය සංචාරකයින් මුදල් අඩුවෙන් වැය කරන හා අඩු දිණගණනක් ලංකාවේ රැඳී සිටින පිරිසකි. බටහිර සංචාරකයකුගේ සාමාන්‍ය නැවතී සිටින කාලය දින 10.2 ක් වන අතර, එය ඉන්දීය සංචාරකයකුගේ දින 8.1 කි. අනෙක් අතට ඉන්දීය සංචාරකයින් බහුතරයක් ලංකාවේ රැඳී සිටිය කාලය දින 2 ක් වන අතර, බටහිර සංචාරකයින් බහුතරය දින 14 ක් රැඳී සිටිබව සංචාරක සංවර්ධන අධිකාරියේ සමීක්ෂණ වාර්තාව (2008/09) පෙන්වා දෙයි. අඩු වියදම හා අඩු දිනගණනක් රැඳී සිටීම බොහෝ විට සංචාරක ආදායම සම්බන්ධයෙන් වැරදි නිගමන වලට එළඹීමට හේතුවන නමුත්, එය සත්‍ය නොව බව දක්නට ඇත. බටහිර හා ඉන්දීය සංචාරකයින්ට සැපයෙන සංචාරක සේවා එක හා සමාන නොවන බැවින්, පිරිවැය වෙනස්කම් පවතී. මේ හේතුවෙන් ඉන්දීය සංචාරකයකුගෙන් ලැබෙන ලාභ අනුපාතය බටහිර සංචාරකයකුගේ ලාභ අනුපාතයට ද වඩා වැඩි වීමට බොහෝ ඉඩකඩ ඇත.

### නමුත් වැඩි වාර ගණනකින් වැඩි අදායමක්

ලංකාව හා ඉන්දියාව අතර ඇති අඩු දුර හේතුවෙන්, ඉන්දීය සංචාරකයින් අඩු වියදමකින් අඩු දින ගණනක් රැඳී සිටියත්, එම හේතුවෙන්ම ඔව්හු අවුරුද්දක් තුළ වැඩි වාර ගණනක් පැමිණෙන බව දක්නට ලැබේ. සමීක්ෂණ වාර්තා වලට අනුව, සියළුම සංචාරකයින්ගෙන් 40% ක් ද ඉන්දීය සංචාරකයින්ගෙන් 52% ක් ද එක් වරකට වඩා ලංකාවට පැමිණුන අය වෙති. එක් වාරයකින් උපයන සංචාරක ආදායම අඩු වුවත්, වාර ගණන වැඩිවීම හේතුවෙන් උපයන මුළු ආදායම මේ අනුව ඉහළ විය හැකිය.

### අඩු ආදායම් කණ්ඩවලට අයත් සංචාරකයින්

ලංකාවට පැමිණෙන ඉන්දීය සංචාරකයින්, කෙසේ වුවත්, බොහෝ සෙයින් අයත්වන්නේ ''පහළ-මධ්‍යම'' ආදායම් පන්තියටය. මෙයට හේතුව ඉන්දියාවේ

''ඉහළ'' ආදායම් කාණ්ඩවල සංචාරකයින් අමෙරිකාව හා බටහිර යුරෝපා රටවලටත්, ''ඉහළ-මධ්‍යම'' ආදායම් කාණ්ඩවල සංචාරකයින් නැගෙනහිර ආසියාවේ රටවලටත් පිටව යාමේ ප්‍රවණතාවයි. ලංකාවට පැමිණෙන ඉන්දීය සංචාරකයින් අඩුවෙන් වියදම් කිරීම, ලාභදායි ලෙස නවාතැන් පහසුකම් සෙවීම හා අඩු දින ගණනක් රැඳී සිටීම ආදී කරුණු වලට මෙය වැදගත් හේතුවකි. මේ තුළින් මතුවන වඩාත් වැදගත් කරුණ නම් ලංකාවේ සංචාරක කර්මාන්තය ඉන්දියාවේ ඉහළ ආදායම් කාණ්ඩවල සංචාරකයින්ගේ අවශ්‍යතා සැපිරීමට තරම් දියුණු තත්වයට පැමිණ නොතිබීමයි.

## 4. ඉන්දියාවේ සංචාරකයින් ඉන්දියාවට පැමිණෙන සංචාරකයින් ඉක්මවයි

ඉන්දියාවේ සංචාරක කර්මාන්තය අපූර්ව ලක්ෂණ වලින් යුක්ත වන අතර, මේ තත්වය ද ලංකාව වැනි එහි අසල්වාසී රටවල සංචාරක ක්ෂේත්‍රයේ ප්‍රවර්ධනයට මහඟු ඉඩප්‍රස්තා ලබා දී ඇත. ඉන්දියාවට වාර්ෂිකව පැමිණෙන සංචාරකයින් මිලියන 5ක් වුවත්, ඉන්දියාවෙන් පිටතට යන ඉන්දීය සංචාරකයින් ප්‍රමාණය මිලියන 11 ක් වේ. ඊට අමතරව ඉන්දියානු සංචාරකයින් ප්‍රමාණය ඉන්දියාවට පැමිණෙන සංචාරක ප්‍රමාණය ඉක්මවා වර්ධනය වීම ද වැදගත්ය. 2004-2007 කාලය තුළ, ඉන්දීය සංචාරකයින් වාර්ෂිකව 12.4% කින් වැඩි වී ඇති අතර, ඉන්දියාවට පැමිණෙන සංචාරකයින් වාර්ෂිකව වැඩි වී ඇත්තේ 8.4 කිනි.

මධ්‍යම පන්තියේ ශීඝ්‍ර වර්ධනය සංචාරක ඉල්ලුම පුළුල් කරයි

ඉන්දීය සංචාරකයින්ගේ ශීඝ්‍ර වර්ධනය බිලියන 1.1 ක ජනගහණයකින් හෙබි අතිවිශාල ඉන්දියාවේ ශීඝ්‍ර ආර්ථික වර්ධනයෙන් මුළුමනින් නොවුනත් බොහෝ දුරට පැහැදිලි වේ. ඉන්දීය සංචාරකයින් 16% කින් වාර්ෂිකව වර්ධනය වූ 2004-2007 කාලය තුළ ඉන්දියාවේ ආර්ථිකයද ඉහළම වර්ධනය වාර්තා කළේය. මේ කාලය තුළ එහි දළ දේශීය නිෂ්පාදිතය 9% කින් ද, ඒක පුද්ගල ආදායම 7% කින් ද වාර්ෂිකව වැඩි වී ඇත. ඉන්දියාවේ පුළුල් වන මධ්‍යම පන්තියේ වැය කළහැකි ආදායමේ වැඩිවීම විශේෂයෙන්ම සංචාරක ඉල්ලුමේ උත්පාතයකට හේතුවේ.

### විවේකය හා විනෝදය ද, නැතහොත් ව්‍යාපාර කටයුතු හා සාප්පු යෑමද?

ඉන්දීය සංචාරකයින්ගේ ප්‍රියතම රටවල් වන්නේ සිංගප්පූරුව (8%), චීනය (5%), තායිලන්තය (5%), අමෙරිකාව (5%), සහ හොංකොං (4%) ය. මෙම රටවල් 5 න්, ඇතැම් විට අමෙරිකාව පමණක් වෙනස් විය හැක්කේ, එය ඉන්දියාවේ ඉහළම ආදායම් පන්තියේ අවශ්‍යතාවලට ගැලපෙන බැවිනි. නමුත් නැගෙනහිර ආසියා-ාවට අයත් අනෙකුත් රටවල් කීපය ඉන්දියාවේ මධ්‍යම පන්තියේ සංචාරක අවශ්‍යතා වලට ගැලපේ. එසේ වන්නේ, මෙම සංචාරක පිරිසට විවේකය හා විනෝදය පමණක් නොව, ව්‍යාපාර කටයුතු හා සාප්පු සවාරි වලට ද එම රටවල් සංචාරක සේවා සපයන බැවිනි.

ඉන්දියාවේ ප්‍රධාන සංචාරක රටවල් 10 (2005)

| | සංචාරකයින් ගණන (1000) | ප්‍රතිශතය |
|---|---|---|
| සිංගප්පූරුව | 583.5 | 8.1 |
| චීනය | 356.5 | 5.0 |
| තායිලන්තය | 352.8 | 4.9 |
| ඇමරිකා.එ.ජ. | 344.9 | 4.8 |
| හොංකොං | 273.5 | 3.8 |
| මැලේසියාව | 225.8 | 3.1 |
| ශ්‍රී ලංකාව | 113.3 | 1.6 |
| නේපාලය | 95.7 | 1.3 |
| බංගලාදේශය | 86.2 | 1.2 |
| පකිස්ථානය | 59.6 | 0.8 |
| එකතුව | 7184.5 | 34.7 |

Source: http://www.itopc.org/travel-requisite/outbound-tourism-statistics.html

ලංකාව නැගෙනහිර ආසියානු රටවල් අතරටද, නැතහොත් දකුණු ආසියානු රටවල් අතරටද?

ඉන්දීය සංචාරකයින්ගේ ජනප්‍රියම රටවල් 10 අතර, ලංකාවට හිමිව ඇත්තේ 7 වැනි ස්ථානයයි. එම ස්ථානය නැගෙනහිර ආසියාතික් රටවලට වඩා පහළින් වන අතර, දකුණු ආසියාතික රටවලට වඩා ඉහළින් පිහිටයි. ඉන්දියාවේ වේගවත් ආර්ථික දියුණුවත් සමග ඉන්දීය සංචාරකයින් ප්‍රමාණය ද වේගයෙන් වැඩි වන්නේය. මේ තත්වය තුළ, ලංකාව නැගෙනහිර ආසියාතික රටවල් අතරය ඉහළ නැගෙන්නේද, නැතහොත් දකුණු ආසියාතික රටවල් අතර පහළින් සිටින්නේද යන්න ලංකාව විසින්ම තීරණය කළයුතු කරුණකි.

### ලංකාවට ද බොහෝ විභවතා ඇත

ඉන්දීය සංචාරකයින් ගෙන් 1.6% (2005) වැනි සුළු ප්‍රමාණයක් පැමිණුනත්, ලංකාව ද ඔවුන්ගේ ජනප්‍රිය සංචාරක රටවල් 10 තුළ 7 වැනි ස්ථානයට පත්ව ඇත. සමහර විටෙක, ලංකාව හා ඉන්දියාව අතර ඇති භූගෝලීය, ඓතිහාසික හා සංස්කෘතික සබඳතාව, ඉන්දියාව හා නැගෙනහිර ආසියාතික රටවල් අතර ඇති සබඳතාවට වඩා ශක්තිමත් විය හැකිය. කෙසේ වෙතත්, මෙම සියලු සාධකවල ප්‍රතිලාභය අත්පත් කර ගැනීමට ලංකාව සූදානම් වී නැති බව පැහැදිලිය. ලංකාව විවෘත අර්ථක්‍රමයකට හා නිදහස් ආගමන ප්‍රතිපත්තියකට බොහෝ දුරට හිමිකම් කීවත්, එහි සංචාරක හා ව්‍යාපාරික පරිසරය නැගෙනහිර ආසියානු රටවලට සාපේක්ෂව නොදියුණු තත්වයේ පවතී.

### ඉන්දියාවේ සංචාරක පැමිණීමට ඇති අවහිරතා

විදේශීය සංචාරකයින්ගේ පැමිණීම අතින් ඉන්දියාව ද බොහෝ පසුගාමී රටකි. ඉන්දියාවට වාර්ෂිකව බිලියන 5 ක සංචාරකයින් පැමිණෙන විට, ඒ හා සමාන වූ චීනයට එමෙන් දසගුණයයක (බිලියන 50) සංචාරකයින් පැමිණේ. ඉන්දියාව සංචාරකයිනට ජනප්‍රිය රටක් නොවීමට ඉන්දියාවට පැමිණෙන සංචාරකයකුට ඇති විශාල වියදම ද (මෙය කලාපයේ ඉහළම වියදමයි) අප්‍රසන්න සංචාරක පරිසරයද, සංචාරකයිනට බලපාන දැඩි නීතිරීති පද්ධතිය ද හේතුවිය හැකිය. කෙසේ වෙතත්, ඉන්දියාවේ සංචාරක කර්මාන්තයේ ඇති මම වැට කඩොලු ද, එහි අසල්වාසී රටක් වන ලංකාවේ සංචාරක ව්‍යාපාරය පුළුල් වීමට හේතු සාධක බවට පත්විය හැකිය.

## 5. සංචාරක ප්‍රතිපත්තියට අත්වැලක්

ඉන්දියාව සංචාරක ප්‍රභව වෙළඳපොළක් වශයෙන් වේගයෙන් පුළුල් වෙමින් පවතින අතර, එහි වැඩි වාසිය මේ වන විටත් නැගෙනහිර ආසියානු රටවල් දෙසට හැරී තිබේ. එහෙත් ලංකාවට හිමි සුවිශේෂ විභවතාවන් අනුව ඉන්දීය ප්‍රභව වෙළඳපොළේ වාසි ලබමින් ලංකාවේ සංචාරක කර්මාන්තය පුළුල් වීමට පුළුල් ඉඩප්‍රස්තාවන් පවතී. ඉන්දීය සංචාරකයිනට විශේෂයෙන් සැලකෙන ප්‍රතිපත්ති වල අවශ්‍යතාවක් මෙයින් අදහස් නොවන අතර, එවැනි ප්‍රතිපත්ති කර්මාන්තය තුළ ඇති සානුබල ව්‍යුහය විකෘති වීමට ද හේතුවකි. පළමුවෙන්ම, ලංකාවේ සංචාරක කර්මාන්තයේ ප්‍රවර්ධනයට ලංකාවේ ඇති සුවිශේස වාසි අවාසි සමග ඉන්දීය ප්‍රභව වෙළඳපොළේ වැදගත්කම වටහා ගැනීම අවශ්‍යය. ඒ අනුව සමස්ත සංචාරක ප්‍රතිපත්ති රාමුව තුළ මෙම සුවිශේෂ අංගෝපාංග අඩංගු කර ගැනීමෙන්, පහත දැක්වෙන පරිදි ලංකාවට වඩාත් තරගකාරී සංචාරක පරිසරයක් බිහි කළ හැකි වේ.

### විවිධාංගීකරණය වූ සංචාරක අවශ්‍යතාඃ

බටහිර යුරෝපය ආදි වූ අනෙකුත් සංචාරක ප්‍රභව වෙළඳපොළවල් හා සංසන්-දනය කරන කළ, ඉන්දීය සංචාරකයින්ගේ අරමුණු හා අවශ්‍යතා වඩාත් විවිධ වේ. මෙම පුළුල් පරාසයක විවිධ අවශ්‍යතා හා අරමුණු වලට එකවිට සංචාරක සේවා සපයන කේන්ද්‍රස්ථානයක් බවට ලංකාව දියුණු වීම අවශ්‍ය කෙරේ. එබඳු සංචාරක කේන්ද්‍රස්ථානයක් තුළ විනෝදයට හා විවේකයට පමණක් නොව, ව්‍යාපාර කටයුතු, සාප්පු සවාරි, රැස්වීම්, සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන ආදි වූ විවිධ සංචාරක අවශ්‍යතා සඳහා සේවා හා පහසුකම් සැපයේ. මෙහිදි රජයට යටිතල පහුකම්, නීතිය හා සාමය හා නීතිරීති ප්‍රතිසංස්කරණ ආදිය තුළින් පහසුකම් සැපයීමේ කාර්යභාරය ඉටු කළ හැකි අතර, පෞද්ගලික අංශයට ප්‍රධාන ආයෝජකයින්ගේ කාර්යභාරය ඉටුකළ හැකි වේ. ආසියාවේ හා මැදපෙරදිග ජනප්‍රිය සංචාරක කේන්ද්‍රස්ථාන තුළින් ලංකාවට තම සේවාවන් හා ප්‍රමිතීන් පිළිබඳව උගත හැකි වේ. ඉන්දීය සංචාරක ව්‍යාපාරයේ දැනට පවතින දුර්වලතා නිසා ලංකාවට මෙම කාර්යය වඩාත් පහසුවේ.

### ආගමන ක්‍රියාපිළිවෙත් හා නීතිරීතිඃ

සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය අපේක්ෂා කරන ඕනෑම රටක් විසින් අත්‍යවශ්‍යයෙන්ම ප්‍රතිසංස්කරණය කළයුතු ක්ෂේත්‍රයක් වන්නේ රටෙහි ආගමන ක්‍රියා පිළිවෙත් හා නීතිරීති පද්ධතියයි. ලංකාව අනුගමනය කළ වීසා ප්‍රතිපත්තිය 2002 දී ලිහිල් කිරීමේ වැදගත්කම, එම වර්ෂයේදීම ඉන්දීය සංචාරකයින් 100% කට වැඩි අනුපාතයකින් වැඩි වීමෙන්ම සනාථ වේ. දශක ගණනක් යුද්ධයකින් පීඩා විඳි ලංකාවට ආරක්ෂක තත්වය හා සලකන කළ එක්වරම නිදහස් වීසා ප්‍රතිපත්තිය පවත්වාගෙන යාම දුෂ්කර කාර්යයක් වුවත්, මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගතයුතු වැදගත් කරුණු කීපයකි.ඃ

- ගෝලීය ආර්ථික කේන්ද්‍රස්ථානයක් හා සංචාරක කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමට බලාපොරොත්තු වන රටකට ''නිදහස්'' ආගමන ක්‍රියාපිළිවෙතක් හා නීතිරීති පද්ධතියක් ඉතා වැදගත් වේ. මෙම වැදගත්කම සිංගප්පූරුව වැනි රටවල් කිපයක් විසින් මනාලෙස තහවුරු කර ඇත.

- 2002 සිට ක්‍රියාත්මක වූ ''නිදහස්'' වීසා ප්‍රතිපත්තියේ ගැටළුව වන්නේ එම ප්‍රතිපත්තියට වඩා (i) සංචාරකයින්ගේ පෞද්ගලික තොරතුරු නොමැතිකම, (ii) ඔවුන් පිළිබඳ අඛණ්ඩ නිරීක්ෂණ ක්‍රමයේ අඩුපාඩුව හා (iii) නීතිරීති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා යන කරුණුය.

- වඩා නිදහස් ආගමන ක්‍රමයක හා නීතිරීති පද්ධතියක් තුළ ව්‍යාකූලතාවන් හා අවිනිශ්චිතතාවන් සඳහා ඉඩක් නොතිබිය යුතුය. 2002 හඳුන්වා දුන් ''නිදහස්'' වීසා ප්‍රතිපත්තිය තුළ මෙම දුර්වලතා තිබූ බැවින් සංචාරකයින්ට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය.

  මෙම කරුණු වල අවධානය ආගමන ක්‍රියා පිළිවෙත් කෙරෙහි පමණක් යොමුවුවත්, සංචාරක ක්ෂේත්‍රයට සම්බන්ධවන සමස්ථ නීතිරීති පද්ධතියම නැවත අගැයීමට ලක්විය යුතුවේ.

## උතුරු ප්‍රදේශය තුළ කලාපීය ප්‍රවේශ මාර්ගඃ

මේ දක්වාම ජාත්‍යන්තර ගමනාගමනය සඳහා ලංකාවේ විවෘතව පැවතුනේ එකම එක් ප්‍රවේශ මාර්ගයකි. එනම් කොළඹ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළයි. මුහුදු හෝ ගොඩබිම් ප්‍රවේශ මාර්ග නොතිබුණි. විශේෂයෙන්ම ඉන්දීය සංචාරක පැමිණීම් හා ලංකාව-ඉන්දියාව අතර ආර්ථික ගණුදෙනුවල විභවතාව සලකන කළ මුහුදු ගමන් හා ගුවන් ගමන් සම්බන්ධයෙන් විකල්ප ප්‍රවේශ මාර්ග විවෘතවීම අතිශයින් වැදගත්ය. මෙහි වැදගත්කම වඩාත් තහවුරුවන්නේ ජාත්‍යන්තර හෝ කලාපීය ගුවන්තොටුපොලක් හා වරායන් ලංකාවේ උතුරු ප්‍රදේශයේ පිහිටුවීම සම්බන්ධයෙනි. මෙම ක්‍රියාමාර්ගය යුද්ධයෙන් පීඩාවිඳි උතුරු-නැගෙනහිර ප්‍රදේශවල ශීඝ්‍ර වර්ධනය හා සංවර්ධනය සඳහාත් සාමයේ ප්‍රතිලාභ එම ප්‍රදේශවලට ගලායාම වේගවත් කිරීම සඳහාත් හේතුවන බව පැහැදිලි කරුණකි. මේ සඳහා යොමුවූ සාකච්ඡා හා යෝජනා පසුගිය කාලයේ රාජ්‍ය මට්ටමෙන් සැලකිල්ලට භාජනය වී තිබේ.' කෙසේ වෙතත්, වරායවල් හා ගුවන් තොටුපලවල් හුදකලාව පිහිටීම සාර්ථක නොවන අතර, එම ව්‍යාපෘති පුළුල් පරාසයක යටිතල පහසුකම් හා ආර්ථික කටයුතු රාශියක් සමග දැඩිව සම්බන්ධ වී ඇත.

## ආර්ථික සබඳතා ශක්තිමත් කිරීමේ ප්‍රතිසංස්කරණඃ

පසුගිය දශකය තුළ ඇති වූ ඉන්දීය සංචාරක පැමිණීම් ශීඝ්‍ර ලෙස වර්ධනය වීමට, ලංකාවේ ද්විපාර්ශවීය හා කලාපීය ආර්ථික සබඳතා වැඩිදියුණුවීම හේතු වී තිබේ. මේ කරුණ ඉන්දීය සංචාරකයින්ගේ වඩාත් විවිධාංගීකරණය වූ සංචාරක අරමුණු හා අවශ්‍යතා මගින් ද තහවුරු වේ. මෙයින් ඇඟවෙන ප්‍රතිපත්තිමය වැදගත්කම වන්නේ ඉන්දියාව සමඟත් කලාපය සමගත් ලංකාවේ ආර්ථික සබඳතා වඩාත් තහවුරු වීමට අවශ්‍ය ප්‍රතිපත්ති හා රෙගුලාසි ප්‍රතිසංස්කරණ අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු බවයි. කෙසේ වුවද, ද්විපාර්ශවීය හෝ බහුපාර්ශවීය සබඳතා සඳහා යොමු වූ ප්‍රතිසංස්කරණ හොඳම තේරීම නොවේ. හොඳම ප්‍රතිසංස්කරණ යොමුවිය යුත්තේ ''ගෝලීය සබඳතා'' කෙරෙහිය. එසේ වුවද, ඒකපාර්ශවීය ප්‍රතිසංස්කරණ දුර්වල වන විට, අඩු තරමින් ද්විපාර්ශවීය හා බහුපාර්ශවීය සබඳතා වලට යොමු වීම ස්වාභාවිකය. විශේෂයෙන්ම ආයෝජන හා සේවා වෙළඳාම කෙරෙහි බලපාන ප්‍රතිපත්ති හා රෙගුලාසි පද්ධතිය ප්‍රතිසංස්කරණය කිරීම වැදගත් වේ. වෙළඳාම හා ආයෝජන පුළුල්වීමේ ක්‍රියාවලිය තුළ සංචාරක ඉල්ලුම ද ඉහළ යන අතර, ඒ අනුව ඉන්දීය ප්‍රභව වෙළඳපොළ ලංකාවේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රගතියට මහත් පිටුබලයක් වේ.

**මෙම ප්‍රතිපත්ති සන්නිවේෂණය කොළඹ විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යා මහාචාර්ය සිරිමල් අබේරත්නයන් විසින් ස්වකීය විශ්ලේෂණයන් සහ ජෙට්වින් ආයතනයේ සභාපති හිරාන් කුරේ මහතා, ශ්‍රී ලංකා සංචාරක හෝටල් සම්මේලනයේ සභාපති අනුර ලොකු හෙට්ටි මහතා සහ ලර්න් ඒෂියා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ආචාර්ය රොහාන් සමරජීව යන විද්වත් මණ්ඩලය මගින් කොළඹ පැවැති ප්‍රසිද්ධ සංවාදයකදී ඉදිරිපත් කෙරුණු අදහස් පදනම් කරගෙන සකසන ලදී**

'POLICY BRIEF 26'

"පාත්ෆයින්ඩර්" පදනම
දුරකථන අංකයඃ 2 372 895
ඊමේල්ඃ info@pathfinderfoundation.org
වෙබ් අඩවියඃ www.sanvada.org / www.pathfinderfoundation.org

සංස්කරණ සහායඃ අමීරා අරූස් මිය, ව්‍යාපෘති කළමනාකාරිණිය.